ඉන්දියානු මහ **කොමසාරිස්** කාර්යාලය
**කොළඹ**

පුවත්පත් නිව**ේදනය**

## ඉන්දියාවේ මුම්බායි නගරයේ පැවති මාධ්‍ය සහ විනෝදස්වාද ක්ෂේත්‍රය සඳහා ගෝලීය වේදිකාවක් වන ප්‍රථම WAVES සමුළුව සඳහා ශ්‍රී ලංකා නියෝජිත පිරිසක් සහභාගී වේ

සංගීත, සිනමා, රංගන, චිත්‍රපට නිෂ්පාදන සහ බෙදාහැරීම, සජීවිකරණය සහ පරිගණක ක්‍රීඩා ආදී විවිධ ක්ෂේත්‍රවල වෘත්තිකයන්ගෙන් සැදුම්ලත් ශ්‍රී ලංකා නියෝජිත පිරිසක් 2025 මැයි 1 සිට 4 දක්වා ඉන්දියාවේ මුම්බායි නුවර ජියෝ වර්ල්ඩ් කන්වෙන්ෂන් සෙන්ටර් හිදි පැවති ප්‍රථම ලෝක ශ්‍රව්‍ය දෘශ්‍ය සහ විනෝදස්වාද සමුළුව සඳහා සහභාගී වූහ.

2. ඉන්දීය අග්‍රාමාත්‍යතුමාගේ දැක්ම යටතේ ක්‍රියාත්මක වූ සුවිශේෂී මූලපිරීමක් වන WAVES 2025 සමුළුව දේශ සීමා හරහා සංවාද, නිර්මාණශීලිත්වය සහ වාණිජ සහයෝගීතාවයන් ප්‍රවර්ධනය කරමින් ලොව පුරා විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්, ප්‍රතිපත්ති සම්පාදකයන් සහ නිර්මාණශීලි වෘත්තිකයන් එක් වේදිකාවකට ගෙන ආවේය.

3. WAVES 2025 සමුළුවේ ගෝලීය මාධ්‍ය සංවාදය වේගයෙන් වෙනස් වන ගෝලීය මාධ්‍ය පරිසරයක් තුළ විවිධ සංස්කෘතීන් අතර සහයෝගීතාවයන් සහ වගකීම් සහගත කතාන්දර කීමේ අවශ්‍යතාවය අවධාරණය කරමින් WAVES ප්‍රකාශනය සම්මත කර ගැනීමත් සමඟ කූට ප්‍රාප්තියට ළඟා විය. මෙම සමුළුව සඳහා සහභාගී වූ විවිධ රටවල් බෙදීම් යා කරමින් සාමය ප්‍රවර්ධනය කිරීමෙහි ලා සිනමාවේ සහ එක් එක් පුද්ගලයන්ගේ කතාන්දරවලට ඉමහත් බලයක් තිබෙන බවට එකඟ වූහ. සංවාදය විසින් තාරුණ්‍යයේ කුසලතා සංවර්ධනය කරමින් සහ ගෝලීය සම නිෂ්පාදන ප්‍රවර්ධනය කරමින් තාක්ෂණය වගකීම් සහගත ලෙස භාවිතා කිරීමේ වැදගත්කම අවධාරණය කරන ලදී. ලොව පුරා විවිධ භාෂාවල නිර්මාණශීලි දක්ෂයන්ට අවස්ථාව ලබා දෙන Create in India Challenge සමඟින් ඉන්දියාව මේ සඳහා පුරෝගාමී දායකත්වයක් ලබා දෙයි.

4. ශ්‍රී ලංකා නියෝජිත පිරිස සිනමාව, ඩිජිටල් විනෝදස්වාදය, සජීවිකරණය සහ පරිගණක ක්‍රීඩා ඇතුළු විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පැවති සාකච්ඡා, ප්‍රදර්ශන සහ

සබඳතා ගොඩනගා ගැනීමේ වැඩසටහන් සඳහා ක්‍රියාකාරී ලෙස සහභාගී වූහ. මෙම සමුළුව සහභාගී වූ සියලු දෙනා සඳහා ඉතා වටිනා අත්දැකීමක් වූ අතර ඒ තුළින් ඔවුන්ට වැදගත් තොරතුරු දැන ගැනීමට ද ගෝලීය මාධ්‍ය වපසරිය තුළ නවතම ප්‍රවණතා සහ සහයෝගීතාවයන්ට පවතින අවස්ථාවන් පිළිබඳව දැනුවත් වීමට ද අවස්ථාව උදා විය.

5. WAVES 2025 සමුළුව ගෝලීය වශයෙන් දක්ෂතා හුවමාරුව, සම නිෂ්පාදන සහ කර්මාන්තයේ තිරසාර වර්ධනය සඳහා විචිත්‍රවත් වේදිකාවක් වූ අතර මාධ්‍ය සහ විනෝදස්වාද ක්ෂේත්‍රය තුළ කලාපීය සබඳතා ශක්තිමත් කිරීමෙහි ලා වැදගත් පියවරක් ද විය.

***

**කොළඹ**
***2025* මැයි *7***

*Video Link of Global Media Dialogue at WAVES 2025:* https://drive.google.com/file/d/1pB1yVsDxXf_gpyc5KRgCN_PZyjWjFQAn/view?usp=drive_link